# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෂ**

අංක 2363/68 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVPP/LAND/LA/ACQUI/3/10/7.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/18/2019/CEB/612.

පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 371, මාළිළිය උතුර ග්‍රාම නිලධාරි වසමේ මාළිළිය ගමෙහි ක.සි.421511, කලාප අංක 01 පත්‍ර අංක 1 හි 2023.10.24 දින පහත සඳහන් කර ඇති ඉඩම් කැබැල්ල:

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: මල්ගහමුලකුඹුර, ගමවෙලේ මල්ගහ කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: එම්. පී. ඩී. ජයසිංහ; ප්‍රමාණය: හෙක්: 0.0455.

ඉහත සඳහන් ඉඩම් කැබැල්ල සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024.02.08 වැනි දින පෙ.ව. 10.00 ට පොල්පිතිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024 ජනවාරි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩී. එම්. එස්. දසනායක,
ප්‍රාදේශීය ලේකම්/
පොල්පිතිගම.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12-0328



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ආර්බීකේ/එල්ඒඑන්/ඒකිව්යූආර්ඊ/ඒ3/89.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2017/ එච්ඩබ්ලිව්/289.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1 ඒ දොඹේමඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමට අයත්, දොඹේමඩ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 132, අතිරේක අංක 8, පත්‍ර අංක 10 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

01. **කැබලි අංක 506**
ඉඩමේ නම: වගපේඩියාතැන්නේ මුකලාන; විස්තරය: සුසාන භූමිය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - ; ප්‍රමාණය: හෙක්: 0.0024.

02. **කැබලි අංක 507**
ඉඩමේ නම: - ; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - ; ප්‍රමාණය: හෙක්: 0.0149.

03. **කැබලි අංක 508**
ඉඩමේ නම: වගපේඩියාතැන්නේ මුකලාන; විස්තරය: සුසාන භූමිය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - ; ප්‍රමාණය: හෙක්: 0.0004.

04. **කැබලි අංක 510**
ඉඩමේ නම: වගපේඩියාතැන්නේ මුකලාන; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - ; ප්‍රමාණය: හෙක්: 0.0163.

05. **කැබලි අංක 511**
ඉඩමේ නම: වගපේඩියාතැන්නේ මුකලාන; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: - ; ප්‍රමාණය: හෙක්: 0.0053.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 පෙබරවාරි මස 20 වැනි දින පෙ.ව. 10.00 ට රඹුක්කන ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024 පෙබරවාරි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම් (*වැ.බ.*)
රඹුක්කන.

2023 ඔක්තෝබර් මස 20 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය

EOG 12-0329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.